කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 29 (II)

මගේ අංකය: ඩී.එම්.එස්/දීමනා/පොදු
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.
2007.08. 08

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට ජීවන වියදම් දීමනාව ගෙවීම.**

2006.01.17 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 27 හි 04 වැනි ඡේදය හා 2007.01.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 29 (I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ජීවන වියදම් දර්ශකයට අනුව ජීවන වියදම් දීමනාවක් හෝ ඒ හා සමාන දීමනාවක් නොගෙවන්නාවූ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින් සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 29 (I) යටතේ දැනට ගෙවනු ලබන රු.1,750.00 ක මාසික ජීවන වියදම් දීමනාව 2007.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.2,125.00 ක මාසික ජීවන වියදම් දීමනාවක් ලෙස සංශෝධනය කෙරේ.

03. දෛනික වැටුප් ලබන සේවකයින් සඳහා 2007.07.01 දින සිට සේවය කරන දිනකට රු.70.83 බැගින් මසකට රු. 2,125.00 ක උපරිමයකට යටත්ව මෙම දීමනාව ගෙවිය හැකිය.

04. මෙම චක්‍රලේඛය පිළිබඳ කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වේනම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, සමන් ප්‍රනාන්දු මහතා (දුරකථන අංක: 2484644) අමතන ලෙස කාරුණිකව දන්වමි.

පී. බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් -

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. විගණකාධිපති

} දැනගැනීම සඳහා.